**කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 20 ක - 2022**

---

1. **විගණන මතය**

1.1 කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 20 ක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2022 වර්ෂයට අදාලව කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 20 කට අදාලව විගණන වාර්තා නිකුත් කර තිබුණු අතර, එම වාර්තා වලින් එක් කාරක සභාවක මතය ව්‍යාවනය කිරීමක් හා කාරක සභා 19 ක තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත ඇතුලත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි සඳහන් වගන්ති අංක 99 සිට 139 දක්වා වූ වගන්ති ප්‍රකාරව, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයත් ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය සහ ගිණුම්කරණ සටහන් සකස් කර නොතිබුණි. | දෙපාර්තාමේන්තුව ලබාදුන් උපදෙස් අනුව සකස් කර ඇත. ඉදිරියේදී නිවැරදිව සකස් කර ඉදිරිපත් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) කාරක සභා 19 ක මූල්‍ය ප්‍රකාශන අදාලව “ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත” වලට අනුකූලව ඉදිරිපත් කරන බව සහ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී භාවිතා කළ සියළු ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රමිතිය අනුව කටයුතු කරමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ බව සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති පැහැදිලිව සටහන් කළ යුතුය. |

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 20 ක 2022 වර්ෂයේ මුළු වැටුප් වියදම වූ එකතුව රු.418,550,583 ක් වටිනාකම රජයේ ප්‍රදාන ලෙස ආදායමට සහ එම ප්‍රමාණයට වැටුප් වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබූ අතර, එකතුව රු.678,853 ක උපචිත වියදම් 2022 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වැටුප් වියදම සහ උපචිත වියදම උපදෙස් ලබාගෙන ගැලපීම් කිරීමට කටයුතු කරමි. | වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායම් හා වියදමත් සහ උපචිත වියදමත් ඇතුලත් කර මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |
| (ආ) | කාරක සභා 18 ක කාරක සභා පවත්වාගෙන ගිය ලිපිගොනු මගින් විස්තර සොයාගත නොහැකි එකතුව රු.122,738 ක් වූ ව්‍යාජ වගකීම් සහ කාරක සභා 17 ක ලිපිගොනු මගින් තොරතුරු සොයාගත නොහැකි එකතුව රු.2,891,826 ක ව්‍යාජ වත්කම් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් හා වගකීම් ලෙස සටහන් කර මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි. | පිළිගනිමි. මෙම ව්‍යාජ වත්කම් හා ව්‍යාජ වගකීම් මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. | මෙම ව්‍යාජ වත්කම් හා ව්‍යාජ වගකීම් ගිණුම්වලින් ඉවත් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ අක්කර බදු ආදායම ගිණුම්ගත කිරීමේදී කාරක සභා 08 ක් එකතුව රු.115,779 ක ආදායම අඩුවෙන් ගිණුම්ගත කර තිබූ අතර, තවත් කාරක සභා 09 ක් එකතුව රු.177,798 ක් එම ආදායම වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේදී සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. | අක්කර බදු ආදයම නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ තොගය සටහන් කිරීමේදී කාරක සභා 12 කට අදාලව එකතුව රු.251,686 ක යල් පැනගිය බීජ, පැළ, පොහොර තොග භාවිතා කල හැකි සක්‍රීය තොග ලෙස සටහන් කර තිබුණි. | මෙම යල් පැනගිය තොග ඉවත් කිරීමට අනුමැතිය ඉල්ලා ඇත. | යල් පැනගිය තොග ඉවත් කර භාවිතා කළ හැති තොගය පමණක් තොගය ලෙස සටහන් කළ යුතුය. |
| (ඉ) | මදුරාවල කාරක සභාව යටතේ වූ "රෙමුණ " වැව ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා එකතුව රු.16,896,605 ක වියදමක් දරා තිබුණු අතර, එකතුව රු.17,660,256 ක ආදායමක් රැස්කර තිබුණි. මෙම ආදායම හා වියදම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සටහන් කර නොතිබූ | ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල සටහන් කර ඇත. | ආදායම් හා වියදම් එකිනෙකට හිලව් කළ නොහැකි අතර, වෙන් වෙන්ව එම සංඛ්‍යා ආදායම් ප්‍රකාශය තුල සටහන් කළ යුතුය. |

අතර, ශුද්ධ අගය වූ රු.763,651 ක ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් ලෙස දෝෂ සහිතව ගිණුම්ගත කර තිබුණි.

### 1.3.3 නොසැසඳුනු ණය පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 13 ක ගිණුම් විෂයයන් 22 කට අදාළව මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා අතර, ශේෂයන් හි එකතුව රු.676,712 ක නොසැසඳීම් පැවතුණි. | 2023 ගිණුම් වාර්තාවල නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනුව පිළිබඳ විස්තරය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා සහ ගොවිජන බැංකු 20 සඳහා ම 2022 වර්ෂයේදී ජ'නල් සටහන් ගිණුම්ගත කිරීමේදී ජ'නල් වවුචර් පිළියෙල නොකර, අනුමැතිය ලබාගැනීමකින් ද තොරව ජ'නල් සටහන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේදී ජ'නල් වවුචර් පිළියෙල කර අනුමැතිය ලබාගෙන ගිණුම්ගත කරමි. | උපකාර සාක්ෂි සහිතව ජ'නල් වවුචර් සකස් කර අනුමැතිය ලබාගෙන ජ'නලයේ සටහන් කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 17 ක එකතු වටිනාකම රු.28,276,248 කට අදාලව කොටස්, තැන්පත් සහ චෙක්පත් ලේඛන, බැංකු සැසඳුම් වාර්තා, කුඩා කණ්ඩායම් තැන්පත් ලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, ණය ශේෂ ලේඛන සහ ශේෂ සනාථන සහතික වැනි ලිඛිත සාක්ෂි නොතිබීම හේතුවෙන් එම ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | අදාළ උපලේඛණ සහ ලිඛිත සනාථන සාක්ෂි 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | පිළිතුර ප්‍රකාරව 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

1.4 නීතී, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| (i) 21 වගන්තිය | ගොවිජන සේවා කාරක සභාව 20 ක මෙම වගන්තිය ප්‍රකාරව කුඹුරු හිමියන් හා අඳ ගොවීන් පරිහරණය කරන ඉඩම් ප්‍රමාණ පිළිබඳ නාමලේඛනය සංශෝධනය සඳහා වාර්ෂිකව ඉල්ලුම්පත්‍ර ලැබී තිබුණ ද 2011 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා යාවත්කාලීන නොකරන ලද අයදුම්පත්‍ර 135 ක් පැවතුණි. | පිළිගනිමි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ii) 56 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 20 ක් මගින් නීත්‍යානුකූලව අයකර ගත යුතු සියළුම අක්කර බදු මුදල් නියමිත පරිදි අයකර ගෙන නොතිබුණි | පිළිගනිමි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ආ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 133 හා 134 | කාරක සභාවල ගණුදෙණු අභ්‍යන්තර විගණනයට ලක්කර එම වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් අබලි භාණ්ඩ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 880 | ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි | පිළිගනිමි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) කාරක සභා 10 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.3,786,075 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපීව එම කාරක සභා 10 හි ඉකුත් වර්ෂයේ ලාභවල එකතු වටිනාකම රු.858,992 ක් විය. ඒ අනුව එම කාරක සභා 10 හි මූල්‍ය ප්‍රතිඵලයන් හි රු.2,927,083 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට අක්කර බදු ආදායම් වැඩි වීම, ස්ථාවර තැන්පත් පොලී ආදායම් වැඩිවීම, අලෙවිහල් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

එමෙන්ම කාරක සභා 04 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයෙහි එකතු වටිනාකම රු.439,808 ක ලාභයක් වුවත්, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ එම කාරක සභා 04 හි අලාභවල එකතු වටිනාකම රු.508,304 ක් විය. ඒ අනුව එම කාරක සභා 04 හි මූල්‍ය ප්‍රතිඵලන්හි රු.948,112 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට අක්කර බදු ආදායම් වැඩිවීම, පොහොර ආදායම් වැඩිවීම, අලුත්වැඩියා වියදම් අඩුවීම, ගාස්තු ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) කාරක සභා 03 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.1,765,550 ක අලාභයක් පෙන්නුම් කළ අතර, ඊට ප්‍රතිරූපීව එම කාරක සභා 03 හි ඉකුත් වර්ෂයේ ලාභවල එකතු වටිනාකම රු.3,719,173 ක් විය. ඒ අනුව එම කාරක සභා 03 හි මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.5,484,723 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පස් අලෙවි ආදායම් අඩුවීම, ට්‍රැක්ටර් අලුත්වැඩියා වියදම් වැඩිවීම, ලිපිද්‍රව්‍ය වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

එමෙන්ම, කාරක සභා 03 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.267,221 ක අලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ එම කාරක සභා 03 හි ඉකුත් වර්ෂයේ අලාභයන්හි එකතු වටිනාකම රු.331,706 ක් විය. ඒ අනුව එම කාරක සභා 03 හි මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.64,485 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අක්කර බදු ආදායම් වැඩිවීම, අලෙවි ආදායම් වැඩිවීම, පොහොර ආදායම් වැඩිවීම, ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඇ) ගොවිජන බැංකු 20 හි සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.3,191,040 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ එම බැංකු 20 හි ලාභයන් හි එකතු වටිනාකම රු.2,541,108 ක් විය. ඒ අනුව එම ගොවිජන බැංකු 20 හි මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.649,932 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා සක්‍රීයව ගොවීන් වෙත ණය ලබාදීම හා බැංකුවේ වියදම් අවම කිරීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණය අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 යල කන්නයේ යූරියා පොහොර බෙදාහැරීමේදී ගොවි මහතා පොහොර ලබාගැනීමට සුදුස්සෙකු බවට නිර්දේශ කිරීමේදී දෙපාර්තමේන්තු නිලධාරීන්ට අමතරව කෘෂිකර්ම උපදේශක, ග්‍රාම නිලධාරී, ප්‍රාදේශීය ලේකම් නම් කරන සංවර්ධන නිලධාරියෙකුගේ සහය ලබාගැනීම සඳහා වැඩපිළිවෙලක්, සකස් කරගත යුතු වුවත්, කාරක සභා 20 සඳහාම එවැනි වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. | උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 12 ක එකතු වටිනාකම රු.186,240 ක විගණන ගාස්තු පනත ප්‍රකාරව 2023 ඔක්තෝබර් මස දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ගෙවීමට කටයුතු කරමි. | විගණන ගාස්තු නියමිත කාලය තුල ගෙවා පියවිය යුතුය. |
| (ඇ) | කාරක සභා 12 කට අදාලව 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල ලැබී තිබුණු 726 ක් වූ ගොවි පැමිණිලි වලින්, පැමිණිලි 168 කට විසඳුම් ලබාදී නොතිබුණි. | විසඳුම් ලබාදීමට ක්‍රියාකරමින් පවතී | ගොවි පැමිණිලි සඳහා කාරක සභාව කඩිනමින් විසඳුම් ලබාදී නොතිබුණි. |
| (ඈ) | කාරක සභා 11 ක් පවත්වාගෙන යන ඉඩම්වල අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් පවරා ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | ඉඩම් පවරාගැනීමට කටයුතු කරමින් පවතී | පිළිතුරු ප්‍රකාරව පවරාගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාගොඩ කාරක සභා බල ප්‍රදේශය තුල ඛණිජ සම්පත් කැනීම් කටයුතු අවසන් කිරීමෙන් පසුව නියමකර ඇති පරිදි සම්පූර්ණයෙන් වසා නොදමූ වලවල් 04 ක් පවතින බව නිරීක්ෂණය විය. ඛණිජ සම්පත් කැනීම් සඳහා ලබා දෙන ලද අවසර පත්‍රය ප්‍රකාරව එම වලවල් යථාවත් කරවීමට කටයුතු කළ යුතු වුවත්, එසේ ක්‍රියා නොකිරීම පිළිබඳව කාරක සභාව විසින් කිසිඳු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම තත්ත්වය පිළිබඳව කැනීම් කළ පුද්ගලයින් දැනුවත් කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව අදාල භූමිය යළි සකස් කරවීමට ක්‍රියා කළ යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විවිධ කාර්යයන් වෙනුවෙන් මිල්ලනිය ගොවිජන සේවා කාරක සභාව වෙත ලැබුණු එකතුව රු.1,605,166 ක ඇප තැන්පතු මුදල් රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක තැන්පත් කර තිබුණි. පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මගින් ද පෙන්වා දී තිබුණ ද සමාලෝචිත 2022 වර්ෂය අවසාන වන විටද මෙම දීර්ඝ කාලීන ඇප තැන්පතු මුදල් ඵලදායී ආයෝජනයක යෙදවීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි. | 2023 වර්ෂයේදී ආයෝජනය කිරීමට කටයුතු කරමි. | විධිමත් අනුමැතියක් ලබාගෙන මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම සුදුසු වේ. |
| (ආ) ඉංගිරිය කාරක සභාවේ සංවර්ධන කටයුතු සඳහා 2015/2016 වර්ෂවලදී ලැබී ඉතිරි වූ එකතුව රු.209,380 ක මුදලක් කාරක සභාවේ ජංගම ගිණුමේ ඵලදායී කාර්යයකට භාවිතා නොකර ඌන උපයෝජිතව පැවතුණි. | පිළිතුරු ලැබා දී නැත. | ජංගම ගිණුමක පවතින මෙම මුදල් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) මතුගම කාරක සභාවට අදාලව කුඹුරුවල වැලි ගොඩදැමීමට අවසර ලබාදීමේදී ආපසු ගෙවන ඇප ලෙස ලබාගත් රු.600,000 ක් සහ නීතිමය ක්‍රියාමාර්ගයකට යොමු කළ කුඹුරකට ඇප තබන ලද රු.300,000 ක් ඇතුළුව එකතුව රු.900,000 ක ඇප තැන්පතු මුදල් නිදහස් කරන තෙක් ඵලදායී ආයෝජනයක යෙදවීමකින් තොරව බැංකු ජංගම ගිණුමක ඌන උපයෝජිතව පැවතුණි. | පිළිගනිමි. | ජංගම ගිණුමක පවතින මෙම මුදල් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් 2006 වර්ෂයේදී කාරක සභා 02 ක් සඳහා ලැබී තිබුණු අත්ට්‍රැක්ටර් 02 ක් විගණිත 2023 වර්ෂය වන විට ද ක්‍රියාකාරී තත්ත්වයේ පැවතුණ ද ඵලදායී කාර්යයකට භාවිතා නොකර ඌන උපයෝජිතව පැවතුණි. | එකඟ වෙමි. ඉදිරියේදී භාවිතයට යොදාගනිමි. | ඵලදායී කාර්යයක් සඳහා යොදා ගත යුතුය. |
| (ආ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කාරක සභා 02 ක් වෙත ලබාදෙන ලද පරිහරණය කළ හැකි තත්ත්වයේ පවතින සේප්පු 02 ක් විවෘත කර ගැනීමට නොහැකි වීම මත වසර 10 ක පමණ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | විවෘත කර ගැනීමට උපදෙස් ඉල්ලා ඇත. | උපදෙස් ලබාගෙන විවෘත කර භාවිතයට ගත යුතුය. |
| (ඇ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව එකතු වටිනාකම රු.3,292,260 ක් වැයකර පානදුර සහ කනන්විල කාරක සභා භූමි තුල හෙල බොජුන් හල නමින් ආපන ශාලා 02 ක් ඉදිකර තිබුණි. 2022 වර්ෂයේ සිට 2023 ඔක්තෝබර් මස වන විටත් ඵලදායි කාර්යයකට භාවිතා නොකර මෙම ගොඩනැගිලි නිෂ්කාර්ය වත්කම් ලෙස පැවතුණි. | එකඟ වෙමි. | මෙම ආපනශාලා ඵලදායී කාර්යයකට භාවිතා කළ යුතුය. |
| (ඈ) | පමුණුගම කාරක සභා භූමිය තුල මිරිදිය මසුන් වගාකිරීම සඳහා ඉදිකළ ජල ටැංකි ඵලදායී කාර්යයකට භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | පිළිගනිමි. | මෙම ජල ටැංකි ඵලදායී කාර්යයකට භාවිතා කළ යුතුය. |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කාරක සභා 20 ක රාත්‍රී සේවා මුරය සඳහා පමණක් මුරකරුවන් සේවයේ යෙදවීම නිසා ඔහු සේවය ආරම්භකරන වේලාවත් සේවය උදෑසන අවසන් කරන වේලාවත් අතර කාලය තුල මුරකරුවෙකු නොමැති වීම නිසා කාරක සභාව සතු සම්පත් අනාරක්ෂිත තත්ත්වයක පැවතුණි. | මුරකරුවන් දෙදෙනෙකු සිටිය යුතු වුවත්, කාර්යය මණ්ඩලය ලබාදී නැත. | උදෑසන 06 ත් සවස 06 ත් අතර කාලය තුල සම්පත් ආරක්ෂාව සඳහා පියවර ගත යුතුය. |
| (ආ) කාරක සභා 20 කට අදාලව කෘ.ප.නි.ස. වසම් 458 ක් පැවති අතර, අදාල වසම් සඳහා අනුයුක්ත කළ නිලධාරින් සංඛ්‍යාව 363 ක් වීම නිසා වසම් 95 ක වැඩබලන තත්ත්වයක් ඇතිවී තිබුණි. | සේවක ඌනතාවය මත වැඩබැලිමට සිදුව ඇත. | වසම්වල ගොවිජනතාවගේ සේවය නිසි පරිදි ඉටුකර දිමට ක්‍රියා කළ යුතුය. |

### 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කර තිබුණ ද 2022 දෙසැම්බර් 31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඉලක්ක සමග සන්සන්දනාත්මකව පරීක්ෂා කළ හැකි පරිදි එම සැලසුම් සකස් කර නොතිබුණි. තවද සකස් කළ සැලසුම් කිසිවක් පිළියෙල කිරිම, පරීක්ෂා කිරිම සහ අනුමත කිරීම සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | 2023 වර්ෂයේ සැලැස්ම 2022 වර්ෂයේදී සකස් කර ලිඛිත අනුමැතිය ලබාගත යුතුය. |

### 5. ගොවිජන බැංකු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොවිජන බැංකු 13 ක් මගින් ගොවීන් 248 දෙනෙකු වෙත ලබා දි තිබූ එකතුව රු.7,714,341 ක ණය හා පොලී මුදල් අය නොවීම නිසා විනිශ්වය සභා වෙත යොමු කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු.558,425 ක මුදලක් පමණක් අයකර ගැනිීමට හැකිවීම නිසා එදිනට රු.7,155,916 ක් අයකර ගැනීම නොහැකිව පැවතුණි. නමුත් දිගු කාලයක සිට අයකර ගැනීමට නොහැකිව පැවති මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා අධිකරණයේ නඩු පැවරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඇ) කනන්විල ගොවිජන බැංකු අංශය මගින් ගොවි සමාගමක් වෙත එකතුව රු.854,900 ක මුදලක් අවස්ථා දෙකක දී ලබාදී තිබුණි. උප ලෙජර් ගිණුම් අනුව 2000 ඔක්තෝබර් 20 දින පළමු වාරිකය ලෙස රු.450,000 ක් ලබාදී තිබූ අතර, ණය වාරික හා පොලී කිසිවක් අයනොවී තිබියදීත්, 2000 දෙසැම්බර් 19 දින රු.404,900 ක ඉතිරි මුදලද ලබා දී තිබුණි. නමුත් එම ණය සහ පොලී මුදල් විගණිත 2023 ඔක්තෝබර් මස දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ගොවිජන බැංකු 04 ක 2022 වර්ෂයේ භාවිතා කල බැංකු ජංගම ගිණුම් 04 ක් සඳහා 2022 වර්ෂය වෙනුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කර නොතිබුණි.